# අළුත් අවුරුද්දට අළුත් බතක්

බක් මහට එළඹෙන අළුත් අවුරුද්ද අපට අළුත් කලඑළියක් ගෙන දෙන කාලයක්. ඉස්සර නම් මේ කාලෙට විශේෂයෙන් ගම් නියම් ගම්වල කතුරු ඔංචිල්ලා බැඳලා, ගෙවල් අළුතින් හුණු පිළියම් කරලා, කැවුම්, කොකිස්, අතිරස, කැවිලි පෙවිලි පිළියෙළ කරල, බොහොම ජයට අවුරුදු කන්න සූදනම් වෙනවා. අවුරුදු සමයේ දී දෙමා-පියනට දරු දූරියන් ගෙනුත්, දරු දූරියන්ට දෙමාපියන්ගෙනුත් තෑගි බෝග ලැබෙනවා. තම තමන් අතරේ තියෙන සුළු සුළු අමනාප කම් සමහන් කර ගෙන කවුරු කවුරුත් ඉතාමත් සතුටින් කාලය ගත කරන නව අවුරුදු සමයේ දී කරන කියන හැම කට-යුත්තකදී ම පාහේ පැරණි සිරිත් විරිත් වලට මුල් තැනක් ලැබෙනවා. අළුත් අවු-රුද්දේ නොනගතය ලබන කොට වැඩ අත් හරින්න, ලිපි ගිනි නිවා, අයිත් මොල වන්න, අළුත් ඇඳුම් අඳින්න, තම තමන් කරන වැඩ කටයුතුවල යෙදීම සඳහා අළුත් අවුරුද්දේ ඉස්සර වෙලාම ගෙදරින් එළියට පා තබන්න ආදී සෑම කාර්යයක් ම සඳහා ශුභ මොහොතක් තියෙනවා.

## කැවුම් කොකිස්

අළුත් අවුරුදු කාලෙ ලබන්නෙ මහ කන්නෙ ගොයම් කපා පාගා ගෙන අස්වැන්න ගෙට ගත්තායින් පස්සේයි. එතකොට අළුත් අවුරුද්දට කැවුම් කොකිස් ආදී කැවිලි හදන්න අළුත් හාල් ලැබෙනවා. අවුරුද්දට බත් උයන්නෙ කමතෙන් උණු උණුවෙන්ම ගෙනාපු වී තම්බලා කොටලා පිළියෙළ කර ගත්ත අළුත් ම හාල් වලින්. අවුරුදු සිරිත් විරිත් දිවයිනේ සෑම පළාතකම පැවැත් වෙන්නෙ ගොවි කටයුතු හුහක් දුරට අහවර වෙලා අස්වැන්න කපා පාගා ගෙන සෑම දෙනෙක් ම වාගේ තම තමන් ගේ ගොවිපල වල වැඩ වලින් සුළු විවේකයක් ලබා ගෙන ඉන්න කාල සීමාවක දී යි.

අවුරුදු සිරිත් විරිත් වගේ ම හුහක් දුරට ගොවිතැන් කටයුතුවලදීත් ගැමි ගොවි ජන තාව අතර නොයෙකුත් සිරිත් විරිත් පැති රිලා තියෙනවා. විද්‍යාත්මක හැටියට මේ සිරිත් විරිත්වල කිසිම හරයක් නැහැයි කියල කලකට ඉහත දී බොහෝ දෙනෙක් පිළිගත්තත්, දැන් තවත් අය අදහස් කරන්නෙ මේ සම්ප්‍රදයික සිරිත්විරිත් පසුතලයෙහි කිසියම් විද්‍යාත්මක ක්‍රියා මාර්ගයක් පවතින බවයි. කුඹුරක් සි සෑමෙන් පස්සේ වපුරන්න ඉස්සර වෙලා ලියද්දේ හතර කොනේ පහන් දල්වීම ඇතැම්විට සමහර ගොවීන් විසින් පුරුද්දක් කර ගෙන තියෙනවා. සම්ප්‍රදයිකව මෙයින් අදහස් කරන්නෙ ගං-වතුර, නියං, කෘමි රෝග ආදී හානියකට තම වගාව පත් නොවී හොඳ අස්වැන්නක් ලබා ගැනීම සඳහා දෙවි දේවතාවුන් ගේ ආරක්ෂාව ලබා ගැනීම වෙන්න පුළුවනි. විද්‍යාත්මකව බලන කොට පහන් එළිය වෙතට කෘමි සතුන් ඇද ගැනීම නිසාත්, පහන් එළියට බියෙන් කුරුල්ලන් ආදීන් කුඹුරට නොඒමට ඉඩ ඇති නිසාත්, කිසියම් ප්‍රමාණයක ආරක්ෂාවක් අළුතින් වපුරපු කෙතට ලැබෙනවා. පෙර රජ දවස පැවති වප් මඟුල වැනි අවස්ථාවක දීත්, අනියම් ආකාරයෙන් ගොවිතැන් කටයුතුවලට කිසි යම් රුකුලක් ලැබෙනවා. වප්මඟුලක දී යායක සියළු දෙනාම එකතු වෙලා එකම අවස්ථාවක තමන් ගේ ලියැදිවල වී වැපිරි මට කටයුතු කිරීමෙන්, ජලය පාලනය, කෘමි උවදුරු මර්ධනය, ආදී කාර්යයන් වඩාත් පහසු වෙන බව පැහැදිලි ය.

ගැමි ජනතාව ගොවිතැන් කටයුතුවල දී අනුගමනය කරන සිරිත් විරිත් පදනම් විර හිතය, කියලා ඉවත දමන්න පුළුවන්කමක් නැති බව මෙයින් පැහැදිලි යි. විශේෂයෙන් වී ගොවිතැන් කරන කොට ඒ හා සම්බන්ධ සියළු ම කටයුතු වල දී තමන් ගේ කුස ගින්න නිවාලන මේ ධාන්‍යය කෙරෙහි ගෞරවය පෙරදැරි කෙරෙන ආකල්පයක් ගොවි ජනතාව තුළ තියෙනවා. සාමාන්‍ය යෙන් වහරෙහි පාවිච්චි කරන වචන කමතෙ දී පාවිච්චි නොකරන්න පවා ඔවුන් සැලකිලි මත් වෙනවා.

ගොයම් පාගන්න ඉස්සර වෙලා බොහෝ දෙනෙක් කමතෙ ගොම අතුරල එය පිරිසිදු කර ගන්නවා. තවත් අවස්ථාවල දී මේ විදියට පිළියෙල කර ගත්ත කමතෙ මැද සුදු හුණුවලින් රූප සටහනකුත් ඇඳලා ඒ මත කදුරු කොළ, තොලබෝ කොළ, සෞභාග්‍ය ප්‍රතිමූර්තියක් කරන හද්‍රසටයේ සංකේත කිරීමක් වශයෙන් ලී ගැටයක් ආදිය තිය ලයි, ගොයම් මිටි ගෙනවිත් දමන්නෙ. කමත අතිශයින් පිරිසිදු ස්ථානයක් හැටියට සලකා, ගොවි මහතා තමන් පිළියෙළ කළ සීමාව ඇතුළට කාන්තාවකට පය තබන්නවත් ඉඩ දෙන්නේ නැහැ.

## බැත්, මැඩිල්ල

කමත් වහරත් සම්පූර්ණයෙන් ම සාමාන්‍ය වහරෙන් වෙනස් වෙනවා. වී වලට බැත, හරකුන්ට අම්බරුවන්, කුල්ලට යත්ත, පිදුරුවලට මැඩුවන් ආදී වශයෙන්.

දූන් දූන් ගොයම් පැගිම සඳහා ට්‍රැක්ටරය යොදා ගත්තත්, ගැමි පෙදෙස්වල පොදුවේ මේ කාර්ය සඳහා හරකුන් උපයෝගී කර ගන්නවා. රෑ එළිවෙනකන් සිපද රාවය මැද් දේ හඳ එළියේ හරකුන් දක්කමින් තම අස්වැන්න ලබා ගැනීමට වෙහෙස මහන්සි වී කටයුතු කිරීම ගැමි ජනතාවට හුරු පුරුදු දෙයක්.

කමතේ දී අස්වැන්න රැස් කළායින් පස්සේත් ඉටු කළයුතු චාරිත්‍ර වාරිත්‍ර බොහොමයක් තියෙනවා. මොහොතකටවත් අස් වැන්න තනිව කමතේ දමා යාම කිසිසේත් සිදු නොකරන ගොවියා එසේ කළහොත් බහිරවයා විසින් වී හොරකම් කරනු ලැබෙන් නේ යැයි අදහස් කරයි. ඇතැම් විට සොර සතුරු උපද්‍රව වලින් තම අස්වැන්න ආරක්ෂා කර ගැනීම පිළිබඳව තහවුරු වීම මේ විශ් වාසය පසුතලයේ දිවෙන හරය වන්නට පිළිවන. කමතේ සිට නිවසට අළුත් අස් වැන්න ගෙන යන ගොවියා, පළමු කොටම කරන්නෙ ඒ ඒ ප්‍රදේශ ආරක්ෂා කරන්නේ යැයි සලකනු ලබන දෙවි දේවතාවුන් වෙනු වෙන් තම අස්වැන්නෙන් කොටසක් වෙන් කර තැබීම යි. මෙසේ වෙන් කර තබන කොටස් අවුරුදු සමයේ දී කරන කංකාරි පූජා වල දී කැවිලි ආදිය පිළියෙළ කිරීමට උපයෝගී කර ගන්නවා. මේ කංකාරි පූජාව සාමාන්‍යයෙන් තම තමන්ගේ නෑදෑ හිතවත් අය පමණක් සහභාගී කරවා ගෙන පවත්වන පූජෝත්සවයක් උනත්, බලාපොරොත්තු උනාට වැඩි අස්වැන්නක් ලැබුණ හොත් ඇතැම් විට මුළු ගමේ ම ජනතාව සහභාගී කරවා ගෙන ඒ අයට කෑම බීම හේම දීලා ටිකක් ලොකුවට පවත්වනවා. සාමාන්‍යයෙන් තර්කාන්විතව සලකා බැලුව හොත් මෙවැනි පුද පූජාවක් මිනිසා මිථ්‍යා මතයක එල්බ ගෙන ඇතැයි සිතීමට තුඩු දුන්නත් අනියම් ආකාරයකින් හෝ මෙයින් සිදු වෙන සේවයක් නැතැයි කියන්න බැහැ. මෙවන් උත්සවයක දී උස් පහත් කුල මල බේද නොබලා පොදුවේ සියළු දෙනාම පාගේ සමගියෙන් කටයුතු කිරීම නිසා ගෙදරත්, ගමේත් සුහද වාතාවරණයක් ඇති වීමට එය රුකුලක් වෙනවා.

## ගැමි එකමුතුකම

අවුරුදු සමයේ දී ගමේ දුප්පත් පොහොසත් කවුරුත් එක්ව සමාජ ආගමික සිරිත් විරිත්වල යෙදී එකමුතුකම රැක ගැනීමට උත්සාහ කරනවා. දුප්පත්ම කෙනෙකුට උනත් තමන් ගේ කුඩා කුඹුරු කැබැල්ලකින් සුළුවශයෙන් හරි වී ටිකක් ගෙදරට ලැබිල අඟහිඟකම් මොහොතකට අමතක කරන්න පුළුවන් වෙනවා. අළුත් හාල් මංගල්‍යය අවුරුදු කාලෙ පැවැත් වෙන තවත් උත්සවයක්. ගමේ ගෙයක් ගෙයක් පාසා ගොස් අළුත් අස්වැන්නෙන් සම්මාදමක් ලබා ගෙන සියළු දෙනාම එකතු වෙලා අවුරුදු කාලෙ පන්සලට දානයක් දීලා, ඉන්පස්සේ එළඹෙන අවුරුද්ද වාසනාවන්ත කිරීමට රැකවරණය දුන් දෙවි දේවතාවුන්ට පුද පූජා පවත්වලා මෙම මංගල්‍යයෙන් පසුව බොහෝ විට ගමේ වැඩි මහළු, තරුණ, ළපටි, සැම දෙනාම සහභාගිවෙන ක්‍රීඩා තරඟ ආදිය පවත් වනවා. මෙවැනි අවස්ථාවකදීත් උස් පහත් බේදයකින් තොරව සැම දෙනාගේම හදවත පුරා පැතිර යන්නෙ ගමේකම හා එකමුතුකම පිළිබඳ සුහද හැඟීමක්.

මේ විදියට බලන කොට අවුරුදු උළෙලයි, කෙතයි අතර ලොකු සම්බන්ධකමක් පවතිනවා.